# පීඩන ක්‍රියා ආඥාපනත

## 230 වන අධිකාරය

පොදු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

1946 අංක 57 දරන පීඩන ක්‍රියා (සංශෝධන) ආඥාපනතෙන් අවසන් වරට කරන ලද
සංශෝධනය දක්වා සංශෝධන ඇතුළත් කර ඇත

පසු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

# පීඩන ක්‍රියා ආඥාපනත

## පටුන


| වගන්තිය | විස්තරය | පිටුව |
|---|---|---|
| 1. | ලුහුඬු නාමය | 1 |
| 2. | ඇතැම් ක්‍රියා වැරදි බවට පැමිණවීම | 1 |
| 2 (1). | ගෙයක් ආදිය අපවිත්‍ර ලෙස තැබීම | 1 |
| 2 (2). | පිළිකුල් වූ දුගඳ හමන කාණු | 1 |
| 2 (3). | කසළ ගොඩක් හෝ එවැනි දෙයක් තැබීම | 1 |
| 2 (4). | හරකුන්, එළුවන්, ඌරන් ආදීන් තබා ගැනීම | 1 |
| 2 (5). | ගෙය ආදිය දිරා වැටුණු තත්ත්වයකට හෝ වැටෙන තත්ත්වයට තිබෙන්නට හැරීම | 1 |
| 2 (6). | අපතේ යන හෝ පල් වී තිබෙන ජලය එසේ තිබෙන්නට හැරීම ආදිය | 1 |
| 2 (7). | සතුන්ගේ කැත කුණු ආදිය ජලපාරවලට දැමීම | 2 |
| 2 (8). | කුණු මස් ආදිය විකිණීමට තබා තිබීම | 2 |
| 2 (9). | හානිකර දේවල් ආහාර ලෙස විකිණීම | 2 |
| 2 (10). | බලපත්‍ර නොලැබූ කර්මාන්ත ශාලා තබා ගැනීම | 2 |
| 2 (11). | පොල් ලෙලි ආදිය දැමීම | 2 |
| 2 (12). | කුණු ආදිය පාරට හෝ කුණු කාණුවලට විසි කිරීම | 2 |
| 3. | පීඩන ක්‍රියාවක් නැවැත්වීමට අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට දැන්වීම | 2 |
| 4. | වෙළෙඳ පොළවල් තුළට ගෙන් නරක් වූ මස් අල්ලා විනාශ කර දැමිය හැකි බව | 2 |
| 5. | කුමන කර්මාන්ත ශාලා සඳහා බලපත්‍ර ලබා ගත යුතු ද යන්න | 3 |
| 6. | පළාත් පාලන ආයතනයට අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි බව | 3 |
| 7. | අතුරු ව්‍යවස්ථා අධිකරණය විසින් පිළිගත යුතු බව | 4 |
| 8. | වැරදි හා දඬුවම් පිළිබඳ ලුහුඬු විස්තරයක් ප්‍රසිද්ධ කළ යුතු බව | 4 |
| 9. | අතුරු ව්‍යවස්ථා කඩ කිරීම වරදක් බව | 4 |
| 10. | මේ ආඥාපනතින් වෙනසක් ඇති නොවූ අනෙකුත් පීඩන | 4 |
| 11. | දැන්වීම් භාර දීම | 4 |
| 12. | පීඩන ක්‍රියාවක් නැවැත්වීමට පළාත් පාලන ආයතනයකට හෝ මහේස්ත්‍රාත්වරයාට හැකි බව | 4 |
| 13. | අයිතිකරු පැහැර හැර ඇති අවස්ථාවක දී පදිංචිකරුට වැඩ කළ හැකි බව | 5 |
| 14. | අයිතිකරු වෙනුවෙන් පදිංචිකරු විසින් යම් වැඩක් කොට අවසන් කළ අවස්ථාවක දී ඔහු විසින් දරන ලද වියදම කුලියෙන් අඩු කළ හැකි බව | 5 |
| 15. | පදිංචිකරු අයිතිකරුට බාධා කළ හොත් ක්‍රියා මාර්ගය | 5 |
| 16. | ඉඩම්වලට ඇතුල්වීමට බලය | 5 |

# පීඩන ක්‍රියා ආඥාපනත

## පටුන


| වගන්තිය | විස්තරය | පිටුව |
|---|---|---|
| 17. | පළාත් පාලන ආයතනයට හෝ මහේස්ත්‍රාත්වරයාට හෝ ඔවුන්ගේ නිලධරයකුට හෝ බාධා කිරීම | 5 |
| 18. | ඔත්තුකරුගේ කොටස | 5 |
| 19. | නඩු පැවරීමේ සීමාව | 5 |
| 20. | පොලිස් නිලධරයන් ආධාර කළ යුතු බව | 6 |
| 21. | අර්ථ නිරූපණය | 6 |
| | උපලේඛනය (5 වන වගන්තිය) | 6 |


පටුන

පොදු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

# 230 වන අධිකාරිය

## පීඩන ක්‍රියා

**මහජන සෞඛ්‍යය වඩාත් යහපත් ලෙස ආරක්ෂා කර ගැනීම සඳහා ද, පීඩන ක්‍රියා මැඩ පැවැත්වීම සඳහා ද, විධිවිධාන සැපයීම සඳහා පනවන ලද ආඥාපනතකි.**

ආඥාපනත:
1862 අංක 15
1939 අංක 61
1946 අංක 3
1946 අංක 57

**[1863 ජනවාරි 01]**

ලුහුඬු නාමය.

**1**. මේ ආඥාපනත පීඩන ක්‍රියා ආඥාපනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඇතැම් ක්‍රියා වැරදි බව.

**2**. පහත සඳහන් වැරදිවලින් යම් කිසිවක් කරන්නා වූ කවර තැනැත්තකු වුව ද, රුපියල් පනහකට වැඩි නොවන දඬයකට යටත් විය යුතු ය.

ගෙයක් ආදිය අපවිත්‍ර ලෙස තැබීම.

(1) කුලියට දිය හැකි වූ හෝ දිය නොහැකි වූ ද, යම් කිසි පාරක, වීථියක හෝ ප්‍රසිද්ධ මංමාවතක නැතහොත් එවැන්නක් අසල පිහිටියා වූ ද, යම් කිසි ගෙයක්, ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් අයිතිකරු වූ හෝ එවැනි ස්ථානයක පදිංචිව සිටින්නා වූ කවර තැනැත්තකු විසින් වුව ද, යම් කිසි තැනැත්තකුට පීඩනයක් වන ආකාරයට හෝ යම් කිසි තැනැත්තකුගේ සෞඛ්‍යයට හානි වන ආකාරයෙන් අපවිත්‍ර ලෙස හෝ සෞඛ්‍යයට බාධා ලෙස එකී ස්ථානය තැබීම, නැතහොත් තැබීමට ඉඩ හැරීම හෝ එය දුගඳ හමන වල් පැලෑටිවලින් ගහන වීමට ඉඩ හැරීම;

පිළිකුල් වූ දුගඳ හමන කාණු.

(2) කවර තැනැත්තකු විසින් වුව ද, තමා පදිංචිව සිටින ගෙයක්, ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් ඇතුළත හෝ මත දුගඳ හමන අගලක් හෝ පීල්ලක් හෝ කාණුවක් හෝ වැසිකිළි වලක් හෝ අන්කිසි එවැනි භාජනයක් තබා තිබීම;

කසළ ගොඩක් හෝ එවැනි දෙයක් තැබීම.

(3) පාරක, වීථියක හෝ ප්‍රසිද්ධ මංමාවතක නැතහොත් එවැනි ස්ථානයක් අසල පිහිටි ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක පදිංචි කවර තැනැත්තකු වුව ද, ඊට නිසි භාජනයක් ඇතුළත නොදමා යම් කිසි කසළ ගොඩක්, සතුන්ගේ බඩවැල් ආදියත්, කුණු ගොඩක් නැතහොත් අන්කිසි අවැඩදායක හෝ දුගඳ හමන දෙයක් පිය විසිහතරකට වැඩි කාලයක් තැබීම, නැතහොත් තැබීමට ඉඩ දීම, නැතහොත් එවැනි භාජන පිළිකුල් තත්ත්වයක හෝ දුගඳ හමන තත්ත්වයක තිබෙන්නට හැරීම, නැතහොත් එකී දේවල් ඉන් ඉවත් කොට එය ශුද්ධ කිරීමට ශුද්ධ කිරීමට හා පිරිසිදු කිරීමට අවශ්‍ය සුදුසු කටයුතු නොකොට පැහැර හැරීම;

හරකුන්, එළුවන්, ඌරන් ආදීන් තබා ගැනීම.

(4) කවර තැනැත්තකු විසින් වුව ද, තමන් පදිංචිව සිටින ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක හරකුන්, එළුවන්, ඌරන් හෝ අනිකුත් සතුන් පීඩනයක් වන පරිද්දෙන් හෝ යම් තැනැත්තකුගේ සෞඛ්‍යයට හානි කරන පරිදි තබා ගැනීම;

ගෙය ආදිය දිරා වැටුනු තත්ත්වයකට හෝ වැටෙන තත්ත්වයට තිබෙන්නට හැරීම.

(5) ගෙයක, ගොඩනැගිල්ලක හෝ බිත්තියක අයිතිකරු වන කවර තැනැත්තකු විසින් වුව ද, එය දිරා වැටුනු තත්ත්වයක තිබෙන්නට ඉඩ හැරීම, නැතහොත් එම ගෙයි හෝ ගොඩනැගිල්ලේ පදිංචි තැනැත්තන්ට හෝ අසල්වාසී ගෙවල්වලට හෝ ගොඩනැගිලිවලට හෝ ඒවායේ පදිංචිකරුවන්ට හෝ මගීන්ට හෝ අන්තරාදායක තත්ත්වයක එය තිබෙන්නට ඉඩ හැරීම;

අපතේ යන හෝ පල් වී තිබෙන ජලය එසේ තිබෙන්නට හැරීම ආදිය.

(6) කවර තැනැත්තකු විසින් වුව ද, තමා පදිංචිව සිටින ස්ථානය ඇතුළත යම් තැනක අපතේ යන හෝ පල් වී තිබෙන ජලය හෝ වෙනත් දෙයක් තිබෙන්නට හැරීම හෝ වැසිකිළියක හෝ වැසිකිළි වලක තිබෙන දේ පිටට ගලා යාමට හෝ ඉන් පිටතට උරා ගැනීමට ඉඩ හැරීම;

පටුන

සතුන්ගේ කැත කුණු ආදිය ජලපාරවලට දැමීම.

(7) කවර තැනැත්තකු විසින් වුව ද, යම් ජල පාරකට, වැවකට, ජලාශයකට, ළිඳකට, ජල භාජනයකට, ප්‍රණාලියකට හෝ වාරි මාර්ගයකට, සතෙකුගේ මළ කුණක් හෝ යම් කිසි කැත කුණු, කසළ හෝ දුගඳ හමන යම් කිසි දෙයක් විසි කිරීම හෝ දැමීම හෝ පැමිණෙන්ට සැලැස්වීම, නැතහොත් යම් කිසි අපිරිසිදු හෝ දුගඳ හමන ද්‍රව්‍යයක් හෝ දෙයක් හෝ තමා පදිංචිව සිටින ගෙයින්, ගොඩනැගිල්ලෙන් හෝ බිමෙන් වැගිරී යන දෙයක් ගළා යාමට හෝ සේදී යාමට හෝ ඇතුල්වීමට සැලැස්වීම හෝ ඉඩ දීම, නැතහොත් එවැනි ජලය කවර ප්‍රමාණයකට වුව ද අපිරිසිදු වන පරිදි හෝ කිළිටි වන පරිදි යම් කිසිවක් කිරීම;

කුණු මස් ආදිය විකිණීමට තබා තිබීම.

(8) කවර තැනැත්තකු විසින් වුව ද, වෙළෙඳ පොළක, සාප්පුවක, ගොඩනැගිල්ලක, කඩ බක්කියක, නැතහොත් ගෝ ඝාතකයකු විසින් සපයනු ලබන මස්, කුකුළු ආදී පක්ෂීන්, මාළු, පළතුරු හෝ එළවළු වෙළෙඳාම පිණිස පාවිච්චි කරන ස්ථානයක, මනුෂ්‍ය ආහාරයට අයෝග්‍ය වන සතෙකු, මළ කුණක්, මස්, කුකුළන් ආදී පක්ෂීන්, දඩ මස්, පළතුරු හෝ එළවළු තැබීම හෝ යම් ස්ථානයක හෝ මාර්ගයක එවැනි දෙයක් තැබීම හෝ තැබීමට ඉඩ හැරීම;

හානිකර දේවල් ආහාර ලෙස විකිණීම.

(9) කවර තැනැත්තකු විසින් වුව ද, යම්කිසි දෙයක් මනුෂ්‍ය ආහාරයක් හෝ පානයක් වශයෙන් පාවිච්චි කිරීමට නොහැකි වන තත්ත්වයකට පැමිණ තිබේ යයි හෝ නොහැකි වන තත්ත්වයක තිබේ යයි දැන දැන ම හෝ එසේ විශ්වාස කිරීමට කරුණු ඇති ව, එය මනුෂ්‍ය හෝ පානයක් සඳහා විකිණීම හෝ ඉදිරිපත් කිරීම හෝ ප්‍රසිද්ධියේ තබා තිබීම;

බලපත්‍ර නොලැබූ කර්මාන්ත ශාලා තබා ගැනීම.

(10) කවර තැනැත්තකු විසින් වුව ද, 5 වන වගන්තියෙන් විධිවිධාන යෙදී ඇති පරිදි ඒ සඳහා බලපත්‍ර ලබා නොගෙන අහිතකර වූ හෝ පිළිකුල් උපදවන්නා වූ දුර්ගන්ධය පිටවන කර්මන්ත ශාලාවක් හෝ ව්‍යාපාරික ස්ථානයක් තබා ගැනීම;

පොල් ලෙලි ආදිය දැමීම.

(11) කවර තැනැත්තකු විසින් වුව ද, යම් කිසි තැනැත්තකුට පීඩාවක් වන පරිදි හෝ යම් කිසි තැනැත්තකුගේ සෞඛ්‍යයට බාධාවන පරිදි යම් ස්ථානයක පොල් ලෙලි, පොල් කොහු හෝ අන් කිසි දෙයක් තැබීම හෝ දමා තිබීම; සහ

කුණු ආදිය පාරට හෝ කුණු කාණුවලට විසි කිරීම.

(12) කවර තැනැත්තකු විසින් වුව ද පස්, කුණු, අළු හෝ කසළ වත්තකින්, කුස්සියකින් හෝ ඉස්තාලයකින්, කුණු නැතහොත් බිඳුනු වීදුරු හෝ මැටි බඳුන් හෝ අන් කිසි රොඩු යම් වීථියකට, පාරකට හෝ ප්‍රසිද්ධ ස්ථානයකට, අඩි පාරකට, කුණු කාණුවකට හෝ කාණුවකට විසි කිරීම හෝ දැමීම, නැතහොත් සිය මෙහෙකරුවන්ට එසේ කිරීමට ඉඩ හැරීම ද වේ.

පීඩන ක්‍රියාවක් නැවැත්වීමට අයිතිකරුට හෝ පදිංචිකරුට දැන්වීම.

**3**. කවර තැනැත්තකු විසින්, ඉහත සඳහන් යම් පීඩන ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු වීමෙන් පසුව හෝ වරදකරු වීමට ප්‍රථම සෞඛ්‍ය මණ්ඩලයෙන් [1] හෝ නගර සභාවක් හෝ සුළු නගර සභාවක් හෝ එහි යම් නිලධරයකු විසින් හෝ මහේස්ත්‍රාත්වරයකු විසින් හෝ එවැනි ක්‍රියාවක් නතර කිරීමට හෝ අඩු කිරීමට ලිපියකින් දැන්වීමෙන් පසුව ද, එවැනි පීඩන ක්‍රියාවක් කරගෙන ගිය හොත් හෝ කරගෙන යාමට ඉඩ දුනහොත් ඔහු එසේ වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ දැන්වීමෙන් පසු එසේ වරද කරන එක් එක් දිනට රුපියල් දහයකට නොවැඩි අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

වෙළෙඳ පොළවල් තුළට ගොස් නරක් වූ මස් අල්ලා විනාශ කර දැමිය හැකි බව.

**4**. සෞඛ්‍ය මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට, සුදුසු සියලු කාල වේලාවලදී ම, තම සහකාරයන් කැටුව හෝ එසේ නොමැතිව වෙළෙඳ පොළක්, ගොඩනැගිල්ලක්, කඩ බක්කියක් නැතහොත් ගෝ ඝාතකයන්ගේ මස්, කුකුළු ආදී පක්ෂීන්, මාළු, පළතුරු හෝ එළවළු විකිණීමට තබා තිබෙන ස්ථානයක් හෝ ගෝ ඝාතක ස්ථානයක් කරා ගොස් එය පරීක්ෂා කොට එවැනි ස්ථානයක සිටින සතෙකු හෝ තිබෙන

---

[1] 1892 අංක 18 දරන සනීපාරක්ෂක මණ්ඩල ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද මේ සනීපාරක්ෂක මණ්ඩලවල අනුප්‍රාප්තික පළාත් පාලන ආයතන ලෙස සුළු නගර සභා ද, නගර සභා ද සංස්ථාපනය කරනු ලැබ ඇත. මේ අනුව මෙහි සඳහන් "සනීපාරක්ෂක මණ්ඩලය" යන්න වෙනුවට නගර සභාවක් වශයෙන් හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 වන වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවක් වශයෙන් කියවා තේරුම් ගත යුතු ය. මින් ඉදිරියේ මේ ආඥාපනතේ "සෞඛ්‍ය මණ්ඩලය" යනුවෙන් සඳහන් ව තිබෙන සෑම ස්ථානයක ම, ඒ වෙනුවට "පළාත් පාලන ආයතනය" යනුවෙන් සඳහන් කොට ඇත. "සෞඛ්‍ය මණ්ඩලය" යන්නට මේ ආඥාපනතේ දී ඇති අර්ථ නිරූපණ ද බලන්න.

පටුන

මළ කුණක්, මස්, කුකුළු ආදී පක්ෂීන්, දඩ මස්, මාළු, පළතුරු හෝ එළවළු පරීක්ෂා කිරීමට හැකි ය. තව ද එහි මනුෂ්‍ය ආහාර පිණිස තබා තිබෙන ඉහත සඳහන් සතෙකු, සතෙකුගේ මළ කුණක්, මස්, කුකුළු ආදී පක්ෂීන්, දඩ මස්, මාළු, පළතුරු හෝ එළවළු, මනුෂ්‍ය ආහාරයට නුසුදුසු යයි තමාට වැටහී ගියහොත්, එය අල්ලා මහේස්ත්‍රාත්වරයා වෙතට පැමිණ විය හැකි ය. මහේස්ත්‍රාත්වරයා විසින් නිසි තැනැත්තකුගේ සාක්ෂි විභාග කිරීමෙන් පසු එවැනි සතෙකු, සතෙකුගේ මළ කුණක්, මස්, කුකුළු ආදී පක්ෂියෙකු, දඩ මස්, මාළු, පළතුරු හෝ එළවළු මනුෂ්‍ය ආහාරය සඳහා තබා තිබුණු බව ද එවැනි ආහාරයක් පිණිස එය අයෝග්‍ය බව ද, එකී මහේස්ත්‍රාත්වරයාට පෙනී ගියහොත්, එය විනාශ කර දැමීමට හෝ එසේ වෙළෙඳාමට තැබීමෙන් හෝ ආහාර පිණිස පාවිච්චි කිරීමෙන් වළක්වනු පිණිස අන් කිසිවක් කිරීමට හෝ ඔහු විසින් නියම කළ යුතු ය.

කුමන කර්මාන්ත ශාලා සඳහා බලපත්‍ර ලබාගත යුතු ද යන්න.

**5**. යම් කිසි නගරයක සීමා ඇතුළත පිහිටි කිසිම ස්ථානයක් ඒ ස්ථානය ඇතුළත් පරිපාලන ප්‍රදේශය සඳහා පත් කර ඇති පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගෙන් ලබාගන්නා ලද බලපත්‍රයක් යටතේ හැර, අපත්‍ය හෝ පිළිකුල් උපදවන ගඳක් හෝ දුගඳක් හමන යම් කර්මාන්ත ශාලාවක් හෝ ව්‍යාපාරික ස්ථානයක් සඳහා පාවිච්චි නොකළ යුතු ය. තව ද, තම අභිමතය පරිදි කලින් කල එවැනි බලපත්‍ර නිකුත් කිරීමට ද, අමාත්‍යවරයාගේ අනුමතය ඇති ව ඒවා ආපසු කැඳවීමට ද, ඒ සහකාර කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එවැනි බලපත්‍රයක් රුපියල් විසි පහක මුද්දරයක් මත නිකුත් කළ යුතු අතර, එය මෙහි උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූල ව පිළියෙල කළ යුතු ය.

පළාත් පාලන ආයතනයට අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි බව.

**6**. එක් එක් පළාත සඳහා පහත සඳහන් කරුණු පිළිබඳව අතුරු ව්‍යවස්ථා සෑදීමට පළාත් පාලන ආයතනයට හැකි ය:-

(අ) ගෙවල් අයිතිකාරයන් හා ගෙවල්වල පදිංචිකාරයන් විසින් ගෙයක, ඉස්තාලයක, ගව මඩුවක, වීථියක හෝ කවර ස්ථානයක හෝ ඒ අසල, එක් කොට තැබූ දූවිලි, අළු, රොඩු, කුණු පෝර, සතුන්ගේ කසළ හා කැත කුණු, ඉවත් කිරීම සම්බන්ධයෙන් හා එවැනි යම් දෙයක් යම් තැනැත්තකුට පීඩාවක් වන ආකාරයෙන් වීථියක හෝ වීථියක් අයිනේ එක් තැන් කොට තැබීම වැළැක්වීම පිළිබඳ ව;

(ආ) සියලු ම පොකුණු, දිය කඩිති, විවෘත අගල්, කුණු කාණු, හා සෞඛ්‍ය බාධක හෝ සෞඛ්‍යයට අහිතකර විය හැකි කුණු කාණු, අපවිත්‍ර ජලය හෝ දේවල් ඇති හෝ එකතුවීම සඳහා පාවිච්චි කරන ස්ථාන යන මේවායින් වතුර බැස යාමට සැලැස්වීම, එවැනි ස්ථාන ශුද්ධ කිරීම, වැසීම හෝ පුරවා දැමීම සඳහා;

(ඇ) අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් ද, ආරක්ෂාව හා අණ දීම භාරව සිටින තැනැත්තන් ද විසින් ගෙවල්, ගොඩනැගිලි, දේවස්ථාන හා ජනතාව එක් රැස් වන ස්ථාන ශුද්ධ කිරීම, පිරිසිදු කිරීම, ඒවාට වාතාශ්‍රය ලබා දීම හා ඒවායේ විෂ බීජ විනාශ කිරීම සඳහා;

(ඈ) වසංගත රෝග, ස්ථානික රෝග හෝ ස්පර්ශයෙන් බෝවන රෝග වැළැක්වීම හෝ මර්දනය කිරීම සඳහා හා එවැනි රෝග පවතින කාලවල දී, මළ සිරුරු වහා වැළලීම සඳහා; සහ

(ඉ) මේ ආඥාපනතින් විශේෂයෙන් පනවා නොමැති, එහෙත් මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීම හා පීඩන ක්‍රියා මර්දනය කිරීම පිණිස අවශ්‍ය වන වෙනත් සියලු කරුණු සඳහා ද වේ.

එසේ වුව ද, එවැනි අතුරු ව්‍යවස්ථා මේ ආඥාපනතේ විධිවිධානවලට අනනුකූල නොවිය යුතු අතර ඒවා අමාත්‍යවරයා විසින් අනුමත කරන තෙක් හා අනුමත නො කළහොත්, වලංගු හා ක්‍රියාත්මක නොවිය යුතු ය; එසේ ම, තමාට සුදුසු යයි වැටහෙන පරිදි ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරමින් ඒ අතුරු ව්‍යවස්ථාවලට අවසර දීමට හෝ ඒවා සංශෝධනය කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ද අමාත්‍යවරයාට බලය තිබිය යුතු ය.

පටුන

එසේ ම, ඉහත කී පළාත් පාලන ආයතනයකට එවැනි අතුරු ව්‍යවස්ථා වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට ද බලය තිබිය යුතු ය.

**7**. එවැනි අතුරු ව්‍යවස්ථා ඉහත සඳහන් පරිදි අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමෙන් පසු, ඒවා අධිකරණ විසින් සහ මහේස්ත්‍රාත්වරුන් විසින් නීතියක් වශයෙන් පිළිගත යුතු ය. අතුරු ව්‍යවස්ථා අධිකරණය විසින් පිළිගත යුතු බව.

**8**. මේ ආඥාපනතින් හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවකින් හෝ දඬුවම් පමුණුවන ලද වැරදි ද, එකී එක් එක් දණ්ඩන මුදලේ ප්‍රමාණය ද, අඩංගු ලුහුඬු විස්තර, ඉංග්‍රීසි, සිංහල හා දෙමළ භාෂාවලින් මුද්‍රණය කරවා එය ප්‍රසිද්ධ කිරීම පිණිස ඒවායේ පිටපත් විසුරුවා හැරීමට පළාත් පාලන ආයතනය විසින් ක්‍රියා කළ යුතු ය. වැරදි හා දඬුවම් පිළිබඳ ලුහුඬු විස්තරයක් ප්‍රසිද්ධ කළ යුතු බව.

**9**. ඉහත සඳහන් ආකාරයට සාදන ලද කවර අතුරු ව්‍යවස්ථාවක් වුව ද, කඩ කිරීම වරදක් වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් විස්සකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය. වරද අඛණ්ඩව කරගෙන යන අවස්ථාවක, මුල් වරදට වරදකරු වූ දින සිට හෝ පළාත් පාලන ආයතනය විසින් නැතහොත් ඒ වෙනුවෙන් එහි යම් නිලධරයකු විසින් හෝ මහේස්ත්‍රාත්වරයා විසින් හෝ එකී පීඩාව ඉවත් කළ යුතු බවට ඔහුට දැන්වූ දින සිට ගත වන එක් එක් දිනට රුපියල් පනහකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය. එසේ දඩ මුදලක් නියම කිරීමට මහේස්ත්‍රාත්වරයකුට දඩ මුදල් නියම කිරීම පිළිබඳ සීමාව ඉක්මවා ඇත්තේ වුව ද, එය නොතකා එවැනි වරදක් විභාග කිරීමට ද සහ දඩ නියම කිරීමට ද මහේස්ත්‍රාත්වරයකුට බලය තිබිය යුතු ය. අතුරු ව්‍යවස්ථා කඩ කිරීම වරදක් බව.

**10**. වෙනත් යම් ආකාරයකින් පීඩනයක් වශයෙන් සලකනු ලබන හෝ මේ ආඥාපනත බලාත්මක නොවී තිබුනේ නම් පීඩනයක් ලෙස සලකනු ලබන යම් ක්‍රියාවක් කිරීම හෝ නොකර හැරීම, මේ ආඥාපනතේ සඳහන් කිසිවකින් නීත්‍යානුකූලව කරනු ලබන ලෙස හෝ එවැනි පීඩන ක්‍රියාවක් කිරීම පිළිබඳව වරදකරු වූ තැනැත්තකුට විරුද්ධව පැවරිය හැකි අපරාධ හෝ සිවිල් නඩු පැවරීමකින් නිදහස් කරනු ලැබිය හැකි ලෙස නො සැලකිය යුතු ය. මේ ආඥාපනතින් වෙනසක් ඇති නොවූ අනෙකුත් පීඩන.

**11**. යම් ගොඩනැගිල්ලක අයිතිකරුට හෝ පදිංචිකරුට මේ ආඥාපනතින් යම් දැන්වීමක් භාර දිය යුතුව තිබෙන විට, එකී දැන්වීම, අවස්ථානුකූල ව අයිතිකරු නමින් හෝ පදිංචිකරු නමින් ලියා පිළියෙළ කොට එකී ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ පදිංචිකරු වෙත භාර කළ හැකි ය. නැතහොත් ඔහුගේ පවුලේ වයස් පිරුණු තැනැත්තකුට දිය හැකි ය. තව ද, දැන්වීම භාර කිරීමට නොහැකි වුවහොත්, නැතහොත් පදිංචිකරුවකු එහි නොසිටිය හොත් එය එකී ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ ප්‍රකටව පෙනෙ කොටසක සවිකර තැබිය යුතු ය. එවැනි දැන්වීමක පදිංචිකරුගේ හෝ අයිතිකරුගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතු ය. දැන්වීම් භාර දීම.

**12**. යම් පීඩන ක්‍රියාවක් නතර කළ යුතු යයි හෝ මේ ආඥාපනත හෝ යම් අතුරු ව්‍යවස්ථාවක් අනුව, යම් වැඩක් හෝ දෙයක් ඉෂ්ට කළ යුතු යයි හෝ කළ යුතු යයි කවර අවස්ථාවක දී වුව ද, පළාත් පාලන ආයතනයට හෝ මහේස්ත්‍රාත්වරයාට පෙනී ගියහොත් අවස්ථානුකූල ව, අයිතිකරු වෙත හෝ වෙත දැන්වීමක් කරමින් එකී පීඩන ක්‍රියාව නතර කරන ලෙස හෝ එකී වැඩය හෝ දෙය ඉෂ්ට කරන ලෙස හෝ කරන ලෙස නියම කිරීමට ඒ පළාත් පාලන ආයතනයට හෝ මහේස්ත්‍රාත්වරයාට හැකි ය. එකී දැන්වීමෙන් පසු, එකී පීඩනය ඉවත් කිරීම හෝ එකී වැඩය ඉෂ්ට කිරීම හෝ එකී දෙය කිරීම හෝ නොකර පැහැර හරින ලද්දේ නම්, එකී පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනයක් නියම කර තිබුනේ වුව ද, නොතිබුනේ වුව ද, එකී පීඩනය ඉවත් කරවීමට හෝ එකී වැඩය ඉෂ්ට කරවීමට හෝ එකී දෙය කරවීමට පළාත් පාලන ආයතනයට හෝ මහේස්ත්‍රාත්වරයාට හැකි ය. එසේ කරවීමේ දී දරන ලද වියදම, අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් හෝ නොගෙවන ලද්දේ නම්, එකී වැඩය ඉෂ්ට කරවීමට හෝ එකී දෙය කරවීමට යොදනු ලැබූ තැනැත්තා විසින් මහේස්ත්‍රාත්වරයාට ඒ බව දැනුම් දී ඊට සුදුසු සාක්ෂිකරුවන් දෙදෙනෙකුගේ සාක්ෂිවලින් එම මුදලේ ප්‍රමාණය සෑහෙන ප්‍රමාණයක් බව ඔප්පු කරනු ලැබුවහොත්, පීඩන ක්‍රියාවක් නැවැත්වීමට පළාත් පාලන ආයතනයකට හෝ මහේස්ත්‍රාත්වරයාට හැකි බව.

පටුන

මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබූ සාමාන්‍ය දඩ මුදලක් පරිදි ම, එම මුදල අයකර ගත හැකි ය.

**13**. ඉඩමක අයිතිරුවකු විසින් කළ යුතු යම් වැඩක් නොකර, ඔහු එය පැහැර හැර ඇති අවස්ථාවක දී, ඒ ඉඩමේ පදිංචිකරුට ඒ වැඩය කරවා අවසන් කළ හැකි ය. එවිට ඒ සඳහා දරන ලද වියදම අයිතිකරු විසින් ඔහුට ගෙවිය යුතු ය. අයිතිකරු පැහැර හැර ඇති අවස්ථාවක දී පදිංචිකරුට වැඩ කළ හැකි බව.

**14**. මේ ආඥාපනත යටතේ කළ යුතු යම් වැඩක්නොකර පැහැර හැර ඇති ඉඩමක අයිතිකරු විසින් කළ යුතු යම් වියදමක් හෝ ගෙවිය යුතු යම් මුදලක් හෝ එහි පදිංචිකරුට ගෙවීමට සිදු වූ විට, එවැනි වියදම සම්බන්ධයෙන් ඔහු විසින් ගෙවන ලද ඔහුගෙන් අයකර ගන්නා ලද මුදල ඉඩම අයිතිකරුට ඔහු විසින් ගෙවිය යුතු කුලියෙන් අඩු කර ගැනීමට එහි පදිංචිකරුට නීත්‍යානුකූ ව හැකි ය. තව ද එකී වියදම් තමාට ගෙවන තෙක්, හෝ තමා වෙත ඉදිරිපත් කරන තෙක් එවැනි ගෙයක ස්වාමිත්වය තබා ගැනීමේ අයිතිය ඔහුට ඇත්තේ ය. අයිතිකරු වෙනුවෙන් පදිංචිකරු විසින් යම් වැඩක් කොට අවසන් කළ අවස්ථාවක දී ඔහු විසින් දරන ලද වියදම කුලියෙන් අඩු කළ හැකි බව.

**15**. යම් කිසි අයිතිකරුවකු විසින්, මේ ආඥාපනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම පිණිස තමා අදහස් කර සිටින බව පදිංචිකරුට දැනුම් දීමෙන් පසු, එකී පදිංචිකරු විසින් අයිතිකරුට එසේ කිරීමට ඉඩ නොදී වැළැක්වුවහොත්, ඒ පිළිබඳ සාක්ෂි ඔප්පු කිරීමෙන් පසු, මේ ආඥාපනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු වැඩ කිරීමට එකී අයිතිකරුට ඉඩ දෙන ලෙස නියම කරමින් එකී පදිංචිකරු වෙත ලිඛිත ආඥාවක් කිරීමට මහේස්ත්‍රාත්වරයාට හැකි ය. එකී ආඥාව කිරීමෙන් දවස් අටක් ගත වූ පසු, එකී වැඩ කිරීම සඳහා ඉඩ දීමට එකී පදිංචිකරු ඉඩ නොදුනහොත්, එසේ ඉඩ නොදෙන එක් එක් දිනට රුපියල් විස්සකට නොවැඩි මුදලක් බැගින් වූ දඩයකට එකී පදිංචිකරු යටත් විය යුතු ය. එසේ ඉඩ නොදී තිබෙන කාලය ඇතුළත දී, එසේ ඉඩ නොදෙනු නොලැබූයේ නම්, ඒ වැඩ නොකර පැහැර හැරීමේ හේතුවෙන් අයිතිකරුට යටත් විය හැකි ව තිබුණු දණ්ඩනවලින් ද, එවැනි සෑම අයිතිකරුවෙකු ම නිදහස් විය යුතු ය. පදිංචිකරු අයිතිකරුට බාධා කළ හොත් ක්‍රියා මාර්ගය.

**16**. මේ ආඥාපනතේ කාර්ය සඳහා යම් ඉඩමක් පරීක්ෂා කිරීම පිණිස හෝ එහි තිබෙන පීඩනයක් ඉවත් කිරීම පිණිස හෝ මේ ආඥාපනතින් නියම කරන ලද වැඩක් ඉෂ්ට කිරීම පිණිස හෝ දළුවල් කාලය තුළ සැහෙන ඕනෑම වේලාවක තමන් ම හෝ තමන්ගේ නිලධරයන් මාර්ගයෙන් යම් ඉඩමකට ඇතුල්වීමට පළාත් පාලන ආයතනයකට හෝ මහේස්ත්‍රාත්වරයකුට හැකි ය. තව ද එසේ ඇතුල්වීමේ හේතුවෙන් හෝ මේ ආඥාපනත අනුව එකී ඉඩමේ ඕනෑම තැනක යම් දෙයක් කිරීමේ හේතුවෙන් එකී පළාත් පාලන ආයතනය හෝ මහේස්ත්‍රාත්වරයා යම් කිසි නීති කෘත්‍යයකට හෝ හිංසාවකට භාජන නොවිය යුතු ය. ඉඩම්වලට ඇතුල්වීමට බලය.

**17**. පළාත් පාලන ආයතනයට හෝ මහේස්ත්‍රාත්වරයකුට හෝ සිය යුතුකම් ඉටු කිරීමේ නියුක්ත ඔවුන්ගේ යම් නිලධරයකුට හෝ මෙහෙකරුවකුට හෝ ඔවුන්ගේ යුතුකම් ඉටු කිරීම සඳහා හෝ මේ ආඥාපනතේ බලය අනුව හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් තමන් විසින් කළ යුතු හෝ කිරීමට නියම වී ඇති යම් කිසිවක් කිරීම සඳහා යොදා ඇති තැනැත්තකුට බාධාවක් හෝ හිංසාවක් කරන කවර තැනැත්තකු වුව ද වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් පනහකට නොවැඩි දඩයකට ද ඔහු යටත් විය යුතු ය. පළාත් පාලන ආයතනයට හෝ මහේස්ත්‍රාත්වරයකුට හෝ ඔවුන්ගේ නිලධරයකුට හෝ බාධා කිරීම.

**18**. මේ ආඥාපනත අනුව යම් දඩයක් නියම කරන මහේස්ත්‍රාත්වරයකුට, ඒ මුදලෙන් දෙකෙන් කොටසකට නොවැඩි යම් මුදල් කොටසක් ඔත්තුකාරයාට ප්‍රදානය කළ හැකි ය. ඔත්තුකරුගේ කොටස.

**19**. මේ ආඥාපනත යටතේ කරන ලද යම් වරදක් කිරීමෙන් මාස තුනක් ඇතුළත දී, ඒ පිළිබඳව මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැමිණිල්ලක් නොකළ හොත්, ඒ පිළිබඳව කිසි දඩයකට කවර හෝ තැනැත්තකු යටත් නොවිය යුතු ය. නඩු පැවරීමේ සීමාව.

පටුන

**20**. මේ ආඥාපනතට විරුද්ධව සිය නිල සීමා ඇතුළත කරනු ලබන සියලු වැරදි වැළැක්වීම සම්බන්ධයෙන් ආධාර දීම පොලිස් හමුදාවේ සියලු ම නිලධරයන්ගේ ද, සියලු ම ග්‍රාම නිලධරයන්ගේ ද සාමාන්‍යයෙන්, පොලිස් හා සාම නිලධරයන්ගේ ද යුතුකම විය යුතු ය. තමාගේ ම හැඟීම අනුව හෝ අනුන්ගෙන් ලැබුණු ආරංචි අනුව හෝ එවැනි වරදක් පිළිබඳව දැන සිටින යම් කිසි නිලධරයකු හෝ ග්‍රාම නිලධරයකු ඒ සඳහා යථා පරිදි පත් කොට ඇති බලධරයා ඉදිරියේ වහාම හා උනන්දුවෙන් එය පැමිණිලි කිරීමට අපොහොසත් වුවහොත්, ඔහු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කිරීමේ දී රුපියල් පනහකට නොවැඩි දඩයකට ද යටත් විය යුතු ය. පොලිස් නිලධරයන් ආධාර කළ යුතු බව.

**21**. මේ ආඥාපනතේ පද සම්බන්ධයෙන් තේරුම් ගැනීමේ දී - අර්ථ නිරූපණය.

"සෞඛ්‍ය මණ්ඩලය" යන්නෙන්, පළාතේ සෞඛ්‍ය මණ්ඩලය ද; එකී යම් සෞඛ්‍ය මණ්ඩලයක් පසු අවස්ථාවක දී, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් වශයෙන් සංස්ථාපනය වී ඇති විටෙක, ඒ නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව ද;

"මහේස්ත්‍රාත්වරයා" යන්නෙන්, පීඩනයට පත් වන්නා වූ හෝ යම් වැඩක් ඉෂ්ට කළ යුතු හෝ කළ යුතු ස්ථාන පිහිටි මහේස්ත්‍රාත් අධිකරණ බල සීමාව අදාළ වන මහේස්ත්‍රාත්වරයා ද;

"පරිපාලන ප්‍රදේශය" යන්නෙන්, පළාත් පාලන (පරිපාලන ප්‍රදේශ) ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ විස්තර කරන ලද පරිපාලන ප්‍රදේශයක් ද;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, කිසියම් නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් ද අදහස් විය යුතු ය.

**උපලේඛනය** (5 වන වගන්තිය)

. . . . . . . . . . . . . . . . . . . . . පදිංචි, ඒ. බී. ට . . . . . . . . . . . . . . . . . . . . . . . . . කර්මාන්ත ශාලාවක් හෝ ව්‍යාපාරික ස්ථානයක් තැබීමට මෙයින් බලය දෙන ලදී.

සී. ඩී.

. . . . . . . . . . . . . . . . පරිපාලන ප්‍රදේශය

සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්

පටුන

පහසු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර